**මධ්‍යම පළාත් සභාව - 2014**

**-----------------------------------**

මධ්‍යම පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI-1000-1810) අනුරූපව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන

පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, මධ්‍යම පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වා ගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල
------------------------

පළාත් සභා අරමුදල් ගිණුම 2015 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2015 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුම් පිළිබඳ විස්තර | | 2014 වර්ෂයට අදාල ගිණුම් මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | වත්කම් හා බැරකම් ප්‍රකාශ | 01 | 01 | - |
| ii. | විසර්ජන ගිණුම් | 33 | 33 | - |
| iii. | ආදායම් ගිණුම් | 02 | 02 | - |
| iv. | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම | 65 | 65 | - |
| v. | වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | 06 | 02 |
| vi. | අරමුදල් ගිණුම් | 01 | 01 | - |
| vii. | ප්‍රඥප්ති ගිණුම් | 03 | 01 | 02 |
| viii. | පළාත් සභා මන්ත්‍රී අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| | | 114 | 110 | 04 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : එස්එස්/ඒඑස්/ඒඒ දරන 2013 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර 2013 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් උපචිත පදනම යටතේ පිළියෙල කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ද මධ්‍යම පළාත් සභාව ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් පදනම මත ගිණුම් තැබීම සිදුකර ඇති බව ගිණුම් ප්‍රතිපත්ති අංක 2 යටතේ දක්වා තිබුණද, මූල්‍ය වත්කම් සහ වගකීම් ශේෂ කිහිපයක් උපචිත පදනම මත ගිණුම්ගත කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) පළාත් සභාව ආරම්භයේ සිට මධ්‍යම රජය විසින් සහ පළාත් සභාව විසින් ස්ථාවර වත්කම් වෙනුවෙන් සැලකියයුතු වියදමක් දරා තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.53,265,256 ක වියදම් දරා තිබුණි. කෙසේ වුවද, ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණු අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) පළාත් සභාව යටතේ සංස්ථාපිත අධිකාරි සහ වෙනත් ආයතනවලට අදාළ ගිණුම්, මූල්‍ය ප්‍රකාශනය මගින් ආවරණය නොවන බව අංක 1 දරන ගිණුම් ප්‍රතිපත්තිය යටතේ දක්වා තිබුණද, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දරා තිබුණු රු.423,333,000 ක පුනරාවර්තන වියදම් සහ රු.270,318,522 ක් වූ ප්‍රාග්ධන වියදම් ශීර්ෂ අංක 570 යටතේ අනාවරණය කර තිබුණි.

2.2.4 ගණකාධිකරණ අඩුපාඩු
---------------------------

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය තොගවලින් වර්ෂය අවසානයට වූ ඉතිරි තොග අගයන් ගණන්බලා එම වටිනාකම් ජංගම වත්කම් යටතේ දැක්වීමට පියවර නොගෙන සම්පූර්ණ වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සැපයුම් හා සේවා වියදම් යටතේ දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු විසර්ජන ගිණුම්වල බැරකම් යටතේ දක්වා තිබුණු එකතුව රු.16,336,059 ක් වූ බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන හා වියදම් මත රු.174,534,606 ක් වූ හිඟ බදු ආදායම සහ විකුණුම් හා ගාස්තු මත රු.1,607,951 ක් වූ හිඟ ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) මධ්‍යම පළාත් ගරු මන්ත්‍රීවරුන්ගේ අත්තිකාරම් ගිණුම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබාදී තිබූ රු.35,171,446 ක මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාණිජ අත්තිකාරම් සඳහා වූ ප්‍රාග්ධන දායකත්ව ගිණුම යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍යකාර්ය සාධන ප්‍රකාශයෙහි මූලධන වියදම් (ඇ) යටතේ දැක්විය යුතු රු.2,371,143 ක් වූ වියදම් පුනරාවර්තන ප්‍රතිපාදනවලින් දැරීම හේතුවෙන් අදාළ වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත වී තිබුණි. මෙම හේතුව මත මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ මුලු පුනරාවර්තන වියදම සහ මූලධන වියදම පිළිවෙලින් සමාන අගයෙන් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

(ඊ) හදිසි අවස්ථා අරමුදලේ ස්ථාවර තැන්පතු 2 ක ආයෝජනයෙන් 2014 වර්ෂයට අදාළව ලැබියයුතු උපචිත පොලී ගිණුම්ගත කර නොතිබූ අතර, වර්ෂයේ පොලී ආදායම් රු.61,578 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) 2012 වර්ෂයේදී කල්බදු පහසුකම් යටතේ මිලදී ගෙන තිබූ වෑන් රථ 09 ක්, මෝටර් කාර් රථ 12 හා ඩබල් කැබ් රථ 82 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.83,213,394 ක වාරික මුදල් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෝටර් වාහනවල වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර, තවදුරටත් ගෙවිය යුතු රු.206,051,953 ක් වූ වාරික මුදල ද වගකීම් යටතේ දක්වා නොතිබුණි.

2.2.5 නොසැසඳුනු පාලන ගිණුම්
-------------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන එකතුව රු.1,960,372,251 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් හා ඒවා තහවුරු කෙරෙන උපයෝගී ලේඛන සහ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.297,717,763 ක් විය.

2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

(i) වර්ෂ ගණනාවක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එන ආයතන 5 ක් විසින් නොපියවන ලද එකතුව රු.80,527,173 ක් වූ අනුමත අත්තිකාරම් ශේෂ පියවීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි. මෙම ශේෂයට වසර 3 සිට 11 දක්වා වූ කාලයක් සහිත රු.949,748 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) වාණිජ අත්තිකාරම් සඳහා වූ ප්‍රාග්ධන දායකත්ව ගිණුම යටතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය වෙත ලබාදී තිබුණු රු.1,677,540 ක මුදල නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂවල එකතුව රු.1,183,475,521 ක් වූ අතර, නිලධාරීන් 5,941 දෙනෙකුගෙන් අයනොවී පවතින එකතුව රු.131,657,500 ක් වූ ණය ශේෂ ඊට ඇතුළත්ව තිබුණි. දිගු කාලයක සිට හිඟව පවතින මෙම ණය ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(iv) පළාත් සභා හා අනෙකුත් ආයතන 13 කට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් වෙනුවෙන් එම ආයතනවලින් ලැබිය යුතු රු.4,773,730 ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

වෙනත් පළාත් සභා සහ විවිධ ආයතන 16 කින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් වෙනුවෙන් එම පළාත්වලට ගෙවිය යුතු රු.4,783,323 ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අත්තිකාරම් ගිණුම් සීමා
---------------------------

රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සලසා තිබුණු වියදමෙහි උපරිම සීමාව රු.1,277,278 කින් ඉක්මවා තිබූ අතර, කෘෂිකර්ම අමාත්‍යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලැබීම්වල අවම සීමාවට පිළිවෙලින් රු. 174,520 කින් හා රු.5,437 කින් ළඟානොවී තිබුණි.

2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.86,540,638 ක් වූ වත්කම් ශේෂ 18 ක්ද, එකතුව රු.4,783,324 ක් වූ වගකීම් ශේෂ 16 ක් ද සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි සහ තොරතුරු ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) ප්‍රධාන අමාත්‍ය නිල නිවසේ පවත්වා තිබූ සාකච්ඡා සහ වැඩමුළු සඳහා සහභාගී වූ පුද්ගලයන්ට ආහාරපාන ලබාදීම සඳහා අවස්ථා 25 කදී රු.1,161,352 ක වියදම් දරා තිබුණු නමුත් එම සාකච්ඡාවල සටහන්, සහභාගි වූ සම්පත්දායකයින් හා නිලධාරීන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.8 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | රු. | |
| (i) 2006 අංක 12 දරන මුද්දර බදු පනත | 1,074,005 | අයකර ගත් මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් 2010 ජනවාරි 10 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු මුද්දර බදු, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා විධිමත් අනුමැතියක් ලබානොගෙන රජයේ ආදායමට බැරකර තිබුණි. |
| (ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත අංක 6(අ), 08 සහ 12 වගන්ති | 10,875,163 | පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකුට රුපියල් පනස් ලක්ෂය ඉක්මවූ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය දෙවන අධියරේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 571(2) | 13,551,126 | තැන්පත් කර අවුරුදු 2 කට වැඩි කාලයක් ඉක්මවූ ආයතන 6 කට අදාළ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ඇ) පළාත් මූල්‍ය රීති | | |
| (i) 259.2 රීතිය | 2,260,594 | යොමුගත රීතියේ විධිවිධාන අනුව කටයුතු නොකිරීම නිසා ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.5,225,776 ක අග්‍රිම ගිණුම් ශේෂය තුළ 2003 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාල පරිච්ඡේදයට අයත් අග්‍රිම ශේෂ පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 283.4 රීතිය | 492,523 | ආයතන 7 ක් විසින් නිකුත් කර තිබුණු නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවූ චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ් - 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | නුවරඑළිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 11 ක් සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. |
| (ඉ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් චක්‍රලේඛ<br>-------------------- | | |
| (i) අංක 2007/20 දරන 2007 දෙසැම්බර් 13 දිනැති චක්‍රලේඛය | - | වඩාත් පහසු පාසලක සේවය කළ හැකි උපරිම සේවා කාලය වසර 06 ක් හා පහසු පාසලක උපරිම සේවා කාලය වසර 08 ක් වුවද, එම චක්‍රලේඛයට පටහැනිව තෙල්දෙණිය හා දෙනුවර කලාපයේ වසර 10 සිට වසර 27 දක්වා පරාසයක සේවා කාලයක් ස්ථාන මාරුවීම් නොලැබූ ගුරුභවතුන් 427 දෙනෙකු සිටින බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ii) 2006 ජනවාරි 12 දිනැති අංක 2006/02 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 40 කට සීමා කළයුතු වුවද, සීතාදේවි බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා වූ පන්තිවල එකී සීමා ඉක්මවා සිසුන් 31 සිට 42 දක්වා සිසුන් 148 ක් ඇතුළත් කරගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) 2011 ජූලි 26 දිනැති අංක. FC/PSDGCCBG/ Circular/ 2011/1 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය | 271,650 | ස්වයං රැකියා ස්ථාපනය, ආර්ථික යටිතල හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය, වාරිමාර්ග කෘෂි ආගමික සංස්කෘතික හා ක්‍රීඩා සංවර්ධනය සඳහා පමණක් උපමාන පාදක ප්‍රදාන වලින් වියදම් දැරිය හැකි වුවද ඊට අනුකූල නොවී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 3 කදී වෙනත් වියදම් දරා තිබුණි. |

(උ) වෙනත්

---------

| | | |
|---|---|---|
| (i) 2009 සැප්තැම්බර් මස දින රහිත මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක:මප/අධ්‍යා/ මු/4 දරන ලිපියේ 21 ඡේදය | - | ඉඩම් පිළිබඳ අයිතිය සම්බන්ධයෙන් දී ඇති උපදෙස් අනුව යටිනුවර කොට්ඨාශයට අයත් පාසල් 34 ක් පිහිටා ඇති ඉඩම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) ශ්‍රී ලංකා ජනරජයේ 2009 පෙබරවාරි 20 දිනැති 1589/30 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රයේ xii වැනි පරිච්ඡේදයේ 146(i) | 2,814,412 | කොත්මලේ, නුවරඑළිය, වලපනේ හා හැටන් යන කලාප අධ්‍යාපන කාර්යාල 4 ක ගුරුවරුන් 8 දෙනෙකු හමුදා සේවයට හා ශිෂ්‍ය භට සේවයට දීර්ඝ කාලීනව මුදාහැර තිබුණු නමුත්, ඔවුන්ට පළාත් සභා අරමුදලින් ගෙවන ලද වැටුප් එම ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2015 ජූනි මස වන විටත් කටයුතු කර නොතිබුණි. |

3. ආදායම් කළමනාකරණය

-----------------------------

3.1 ආදායම් ශීර්ෂ අංක ම-10 හා ම-20 ප්‍රධාන ලේකම්

-------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායමේ රු.මිලියන 5 ක අඩුවීමක්ද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් ඌණතාවයේ සියයට 5.85 ක වැඩිවීමක්ද, සමස්ත අයවැය ඌණතාවයේ සියයට 11.67 ක වැඩිවීමක්ද පෙන්නුම් කෙරුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

i. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම්වල රු.744,888,129 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

ii. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් ඌණතාවයේ රු.906,451,710 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ අවසානයට පළාත් සභා අරමුදලේ සමුච්චිත ශේෂය රු.1,514,217,234 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම අගය රු.2,439,088,072 ක් දක්වා රු.924,870,838 වැඩිවී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අවසන් ගිණුමට අනුව මෝටර් වාහන බලපත්‍ර හිඟ ආදායම් ශේෂවල එකතුව රු.79,420,230 ක් වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 කින් බැහැරට මාරුවී තිබූ වාහන පිළිබඳ තොරතුරු ද එම ශේෂයට ඇතුළත්වී තිබූ බව නිරීක්ෂණය විය.

3.2 2012 සහ 2013 යන වර්ෂවලදී සත්ව ආහාර අලෙවියෙන් ලැබී තිබුණු රු.80,453 ක ආදායම් අදාළ පළාත් සභා ආදායම් ගිණුම යටතේ ගිණුම්ගත නොකර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

4. මූල්‍ය සමාලෝචනය
------------------------

4.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.20,941,587,379 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.18,751,665,970 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,189,921,409 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ) මුළු ආදායමට ඌනතාවය
------------------------------

සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය සියයට 17 කින් අඩුවී තිබුණු නමුත්, සමස්ථ ඌනතාවය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.2,189,921,409 ක ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) මුළු ආදායම සහ මුළු වියදම අතර අනුපාතය
-------------------------------------------------

ඉකුත් වර්ෂ දෙකේදී මුළු ආදායම හා මුළු වියදම අතර අනුපාතය වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළද, සමාලෝචිත වර්ෂයේදී එම අනුපාතය සියයට 17 කින් අඩුවී තිබුණි. මුළු ආදායමට එරෙහිව මුළු වියදම 05 ගුණයකින් ඉහළ අගයන් ගෙන ඇති බැවින් එය සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්
-------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) ඇස්තමේන්තුගත බදු ආදායම් ඉලක්කය රු.මිලියන 65.3 කින් හෙවත් සියයට 1.41 කින් ඉක්මවා තිබුණද, ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර රු.67,537 සිට

රු.359,652,610 දක්වා එනම් සියයට 5 සිට සියයට 84 දක්වා පරාසයක ආදායම් අඩුවීම් දක්නට ලැබුණි.

(ii) බදු නොවන ආදායම් හා ගාස්තු යටතේ අපේක්ෂිත ඉලක්කය රු.මිලියන 4.9 කින් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණු අතර, ආදායම් විෂයයන් 3 ක ඇස්තමේන්තු ආදායම හා තථ්‍ය ආදායම අතර රු.499,500 සිට රු.53,560,020 දක්වා හෙවත් සියයට 38 සිට සියයට 94 දක්වා වූ පරාසයකින් අඩුවී තිබුණි.

(iii) වියදම් ශීර්ෂ 4 හි ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම රු.1,593,610 සිට රු.695,938,259 ක පරාසයකින් අඩුවී තිබුණි.

(iv) රජයේ මූලධන ප්‍රදාන යටතේ අපේක්ෂිත ප්‍රතිපාදනවලින් රු.1,435,389,508 ක් හෙවත් සියයට 23 ක් වැයකර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 50(ii) සහ මූල්‍ය රීති 7.2.1 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාර නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළයුතු වුවද, ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර ඉහත දැක්වෙන පරිදි විචලනයන් සිදුවී තිබුණි.

5. අධිකාරී ගිණුම්/ අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

5.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

(අ) විගණන මතය

මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය ව්‍යාවනය කර ඇත.

(ආ) ප්‍රධාන විගණන නිරීක්ෂණ

i. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

* අධිකාරිය විසින් එකතුව රු.1,133,402ක් වූ වියදම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

* 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් සේවක පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් ඇති වන බැරකම් පියවීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත පාරිතෝෂික ප්‍රතිපාදන වල එකතුව රු.38,686,696ක් වුවද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

ii. නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම
-----------------------------------------------------------------------------

ආයතන සංග්‍රහයේ xxxiii පරිච්ඡේදයේ 4.1 වගන්තිය ප්‍රකාරව සේවා ගිවිසුමකට එළඹීමෙන් තොරව නීතිඥ ගාස්තු ලෙස රු.697,100ක මුදලක් ගෙවා තිබුණි.

iii. අධිකාරියට එරෙහිව ඇති නෛතික සිද්ධි
----------------------------------------------

මගී ප්‍රවාහන සේවා අධිකාරියට එරෙහිව භාහිර පාර්ශවයන් විසින් නඩු 09ක් පවරා තිබුණු අතර, රු.1,500,000ක වන්දි ඉල්ලා තිබුණි.

iv. හඳුනාගන්නා ලද පාඩු
--------------------------

අධිකාරියට එරෙහිව සේවයෙන් ඉවත් කළ නිලධාරියෙකු කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ නඩුවක් වෙනුවෙන් රු.208,800ක වන්දි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

5.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
---------------------------------------------------

(අ) විගණන මතය
------------------

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය ව්‍යාවනය කර ඇත.

(ආ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
-----------------------------

i. ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

* ඇස්ෆෝල්ට් ව්‍යාපෘති ආදායම රු.558,376ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.
* බැංකු ජංගම ගිණුමට කර තිබූ රු.14,682,795ක් වූ ඍජු බැරකිරීම් සහ රු.87,428ක් වූ හර කිරීම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

* ඉඩම් හා ගොඩනැගිලි 06ක වටිනාකම් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

* 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සේවක පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් ඇති වන බැරකම් පියවීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත පාරිතෝෂික ප්‍රතිපාදන වල එකතුව රු.6,210,441ක් වුවද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරවු කර නොතිබුණි.

ii. නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

* පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) හා 2.5.1 යන වගන්තිවලට අනුකූල නොවී පිළිවෙලින් රු.1,067,340ක් හා 1,263,984ක් වටිනා මිලදී ගැනීම් කර තිබුණි.

* පළාත් මූල්‍ය රීති අංක 84.7ට අනුකූල නොවී රු.1,299,526ක මිලදී ගැනීම් කර තිබුණි.

* 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්වරුන් 27 දෙනෙකු සමඟ සභාපතිවරයා විසින් රු.214,745,384ක් වටිනා ගිවිසුම්වලට එළඹී තිබුණි.

iii. අධිකාරියට එරෙහිව ඇති නෛතික සිද්ධි

-----------------------------------------------

මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව භාහිර පාර්ශවයන් විසින් නඩු 07ක් පවරා තිබුණු අතර, රු.2,625,649ක් වන්දි ඉල්ලා තිබුණි.

5.3 වාණිජ අත්තිකාරම් ගිණුම්
------------------------------

5.3.1 හැටන් සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම
---------------------------------------------------

(අ) විගණන මතය
-----------------

මතය ව්‍යාචනය කර ඇත.

(ආ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
------------------------------

(i) සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන ප්‍රඥප්තියෙන් බලයදී තිබුණු ලැබීම්වල අවම සීමාව රු.1,760,000 ක් වුවත්, ලභාවී තිබුණු සීමාව රු.1,480,130 ක් වූයෙන් ඇස්තමේන්තු සීමාවට වඩා රු.279,870 ක හෙවත් සියයට 16 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ii) මධ්‍යම පළාතේ ඉගෙනුම ලබන දරුවන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය අරමුණු කරගනිමින් එම පාසල්වල දරුවන්ගේ හා අධ්‍යාපන කළමනාකරුවන්ගේ කාර්ය සාධනය නංවාලීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ඇ) විෂයය අංක 590202 දරන කෘෂිරෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම
--------------------------------------------------------------------

(i) අත්තිකාරම් ගිණුම් කටයුත්ත ආරම්භ කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාළ ව්‍යාපෘති වාර්තාව 2014 සැප්තැම්බර් මාසයෙන් පසුව පිළියෙල කර තිබුණු අතර, එම ව්‍යාපෘති වාර්තාව තුළ බීජ හා රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීමේ සහ විකිණීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය වර්ග අනුව වෙන් වෙන්ව දැක්වෙන පරිදි පිළියෙල කර නොතිබුණි.

(ඈ) විෂයය අංක 591202 දරන ගල්පාලම ගොවිපල අත්තිකාරම් ගිණුම
---------------------------------------------------------------------------

(i) ගිණුම් සමග ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශයේ 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව සහ භාණ්ඩාගාර පොත් අනුව දැක්වෙන ගිණුම් ශේෂ අතර රු.150,052 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) 2014 අවසන් අර්ධ වර්ෂයේ දී ක්ෂේත්‍ර 2 ක ලීක්ස් වගා කර තිබුණු අතර, එක් ක්ෂේත්‍රයක වගාව අසාර්ථක වීම නිසා සිදුවූ රු.25,032 ක අලාභය සහ අනෙක් ක්ෂේත්‍රයේ වගාවෙන් වූ රු.24,402 ක අලාභයන් සමග රු.49,434 ක මුලු අලාභයක් සිදුවී තිබුණි.

(ඉ) විෂයය අංක 592202 දරන ඖෂධ මිලදී ගැනීමේ හා අලෙවි කිරිමේ අත්තිකාරම් ගිණුම
---------------------------------------------------------------------------------------

(i) අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම් දැරීම සඳහා විසර්ජන පනතින් රු.7,500,000 ක ප්‍රතිපාදන සීමාවක් සලසා තිබුණු නමුත්, ප්‍රතිපාදනයෙන් සියයට 48 ක් පමණක් වියදම් දරා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී අත්තිකාරම් ගිණුම් කටයුත්තෙන් අවම වශයෙන් රු.15,000,000 ක් උපයාගත යුතු බව විසර්ජන පනතෙන් සීමා නියම කර තිබුණු නමුත්, උපයාගෙන තිබුණේ රු.4,706,640 ක් හෙවත් සියයට 31 ක් පමණි.

6. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

6.1 කාර්ය සාධනය
------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ කාර්ය සාධනය පහත පරිදි විය.

(i) 2003 වර්ෂයේදී රු.184,000 ක්ද, 2008 වර්ෂයේදී රු.299,950 ක්ද, ගෙවීම් කර තිබුණු යෝජිත විදුලි දිගු දෙක ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අදාළ වියදම් නිශ්කාර්යව පැවතුණි.

(ii) 2009 සිට 2011 දක්වා වූ කාලය තුළ විදුලි ව්‍යාපෘති 62ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට රු.15,410,448ක් ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. රු.14,597,729ක් ගෙවීම් කර තිබූ ව්‍යාපෘති 55ක ප්‍රගතිය සියයට 05 සිට සියයට 50 දක්වා පරාසයක පැවතුණි.

(iii) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 1,725ක් වෙන් කර තිබුණද, වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 07ක් පමණක් නිම කර තිබුණි. ඉතිරි ව්‍යාපෘති 08හි ප්‍රගතිය සියයට 75ත් සියයට 95ත් අතර පරාසයක පැවතුණි.

(iv) "එක් ගමකට එක් වැඩක්" වැඩසටහන යටතේ ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 111.44ක් වෙන් කර තිබුණද, වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 06ක් පමණක් නිම කර තිබුණි. ඉතිරි ව්‍යාපෘති 10 හි ප්‍රගතිය සියයට 25 සිට සියයට 90 ත් අතර පරාසයක පැවතුණි.

(ආ) නිවාස දෙපාර්තමේන්තුව යටතේ මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක ගෙවල් කුලී මණ්ඩල 03 වෙත ලැබී තිබුණු පැමිණිලි 166 න් 2014 දෙසැම්බර් 31 දිනට නොවිසඳු පැමිණිලි සංඛ්‍යාව 124ක් විය.

(ඇ) ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන වැඩමුළුවක් ක්‍රියාත්මක කිරීම, යෝග්‍යතා සහතිකයක හා පොතක මිල වැඩි කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36කට යූවී ලැම්ප් (UV Lamp) ලබා දීම, ඵලදායිතාවයෙන් ඉහල ගරාජ ඇගයීමකට ලක් කිරීම හා ප්‍රවාහන ප්‍රඥප්තිය අනුමත කරවා ගැනීම වැනි ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ඈ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ ඖෂධ නිෂ්පාදන සැලැස්මට අනුව ඖෂධ වර්ග 36 ක තථ්‍ය නිෂ්පාදනය සියයට 30 සිට සියයට 94 දක්වා පරාසයකින් ඇස්තමේන්තුගත ඉලක්කයන් කරා ලගා වී නොතිබුණි.

(ඉ) මධ්‍යම පළාත තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන එහෙත් මධ්‍යම පළාතෙන් පිටත පදිංචි පුද්ගලයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.14,406,365 ක පිරිවැටුම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් වූ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුවී නොතිබුණි.

(ඊ) ප්‍රධාන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාවේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා තිබූ ඊනැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 10 සඳහා පරිගණක 30 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 10 ක් ඇතුළු කාර්යාල උපකරණ අයිතම 10 කට අදාළ ඒකක 216 ක් සහ ගෘහස්ත කොම්පෝස්ට් බඳුන් 2000 ක් මිලදී ගැනීම සඳහා රු.7,262,485 ක් වැය කර තිබුණද විගණන දින වූ 2015 පෙබරවාරි 13 දින වන විටද ඒවා අදාල අරමුණට යොදවා ගෙන නොතිබුණි.

(උ) 2013 මාර්තු 13 දිනැති අංක 2013/11 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පාසැල්වල විවිධ අවස්ථාවලදී මුදල් එකතු කිරීම නොකළ යුතු බව දක්වා තිබියදීත්, ඊට අනුකූල නොවී එක් විදුහලක 2013 සිට 2014 නොවැම්බර් 07 දක්වා කාලය තුළ පළමු වසර ඇතුලු අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් 481 ක් ඇතුළත් කිරීමේදී පිළිවෙලින් රු.6,067,400 ක් හා රු.7,870,990 ක් වශයෙන් එකතුව රු.13,938,390 ක මුදලක් එකතු කර පාසැල් සංවර්ධන ගිණුමට සහ පාසැල් නඟා සිටුවීමේ ගිණුමට බැර කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ තක්සේරුගත හා රැස්කරන ලද බදු ආදායම් සැලකීමේදී රු.මිලියන 65 කින් ආදායමේ වැඩිවීමක් නිරීක්ෂණය විය.

## 6.2 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

(අ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටුකිරීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ 2014 වර්ෂයේදී රු.12,108,412,466 ක් වැය කර තිබූ අතර, ඉන් වැය විෂයයන් 07 ක් යටතේ රු.116,583,127 ක් ප්‍රාථමික හා ද්වීතියික අධ්‍යාපන තත්ත්ව යෙදවුම් සඳහා වැයකර තිබුණි. කෙසේ වුවද, විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ ප්‍රතිඵල සමාලෝචනයක් සිදුවී නොතිබුණු අතර, ප්‍රතිඵල ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගත් බවට හෝ සාක්ෂි ඉදිරිපත් නොවීය. 2014 වර්ෂයේ විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| විභාගය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව | අසමත් මුළු සංඛ්‍යාව | සියළු විෂයයන් අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5 වසර ශිෂ්‍යත්වය | 43,595 | 4,891 | 38,704 | - |
| අ.පො.ස. (සා.පෙ) * | 34,085 | 22,481 | 11,604 | 1,255 |
| අ.පො.ස. (උ.පෙ) * | 25,975 | 15,547 | 10,428 | 1,862 |

* පළාත් සමස්ථ ප්‍රතිඵල අනුව මධ්‍යම පළාතට අ.පො.ස. (සා.පෙ) සඳහා 6 වැනි ස්ථානයත්, අ.පො.ස. (උ.පෙ) සඳහා 7 වැනි ස්ථානයත් හිමිවී තිබුණි.

(ආ) කලාප මට්ටමෙන් 5 වසර ශිෂ්‍යත්වයේදී හා අ.පො.ස. (සා.පෙ) විභාගයේදී දිවයිනේ දිස්ත්‍රික්ක අනුව සමස්ථ මට්ටම පහත දැක්වෙන පරිදි විය.

| විභාගය | සමස්ථ ප්‍රතිඵල අනුව ලබාගෙන ඇති ස්ථානය | | |
|---|---|---|---|
| | මහනුවර | මාතලේ | නුවරඑළිය |
| ශිෂ්‍යත්වය | 11 | 12 | 20 |
| සා.පෙළ | 10 | 19 | 23 |

6.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) උඩදුම්බර සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය ආරම්භ කිරීමට පෞද්ගලික ආයතනයක් සතු දේපල මිලදී ගැනීම සඳහා 2010 දෙසැම්බර් 31 දින ගෙවා තිබූ රු.20,000,000 ක මුදල උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. තෙල්දෙණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2012 ජූනි 26 දින මෙම ඉඩමේ භුක්තිය බාරගෙන තිබුණු නමුත්, 2014 දෙසැම්බර් 31 දින වනවිටත් අදාළ ඉඩම මිලදී ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති 6865 ක් අතුරින් ව්‍යාපෘති 1392 ක් අවිච්ඡේද වී තිබුණි.

(ඇ) 1994 ජූලි 01 දිනැති අංක 24/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සහ 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සම්බන්ධයෙන් පළාත් සභාව විසින් කටයුතු නොකිරීම නිසා 2013 වර්ෂය වෙනුවෙන් යැවිය යුතු රු.87,518,868 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් නිලධාරීන් 86 දෙනෙකුගෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අය කර ගෙන තිබුණු රු.10,157,005 ක් 2003 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඉන් රු.8,113,312 ක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

(ඉ) මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය සේවා ආයතන 76 ක ඉඩම්වල අයිතිය විධිමත්ව රජයට පවරාගෙන නොතිබුණ අතර, මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ඊට අදාළ නිසි පියවර ගෙන නොතිබුණි.

(ඊ) නිවාස දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කළ රු.11,250,000ක මුදල ණය ලබා දීමට නොයොදවා ඌන උපයෝජිතව පැවති අතර, මෙම මුදල ස්ථිර තැන්පතුවක ආයෝජනය කළේ නම් උපයා ගත හැකිව තිබූ රු.3,150,000ක පොලී ආදායම් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

(උ) වසර 18ක කාලයක් තුළ නිවාස දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් නිවාස ණය වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තව දුරටත් අය විය යුතු හිඟ ණය ශේෂය රු.2,696,231ක් විය. තවද විවිධ සේවා සමුපකාර සමිති සහ සමුපකාර ණය දෙන සමිති හරහා පුද්ගලයින් 664 දෙනෙකුට ලබා දී තිබුණු රු.2,873,572ක් වූ ණය ශේෂ හා රු.1,148,090ක පොලී මුදල් අය කර ගැනීම වසර 20කට අධික කාලයක් තිස්සේ ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඌ) පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වූ 2001 මාර්තු 28 දිනැති අංක මුදල්/01/2001 දරන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ චක්‍රලේඛයෙහි 06 ජේදය ප්‍රකාර මන්ත්‍රීධුර අහෝසි වූ පළාත් සභා මන්ත්‍රීවරුන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,496,446 ක ණය ශේෂ පියවා ගැනීම වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලපරාසයක් ප්‍රමාදවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(එ) මධ්‍යම පළාත් සභාවට අයත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විගණන වාර්තා සාකච්ඡා කිරීමේ කටයුතු පළාත් ගිණුම්කාරක සභාව වෙත පැවරී තිබුණද, 2014 වර්ෂය අවසාන වනවිටත් 2008 හා 2009 වර්ෂවලට අදාල විගණන වාර්තාවලට අදාළ සියලුම ආයතන ආවරණය වන පරිදි සාකච්ඡා පැවැත්වීමට සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

6.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මුල්‍ය රීති සංග්‍රහයේ 85,86 සහ 87 යන රීති වල සඳහන් විධිවිධාන වලට අනුව සේවාවන්, වැඩ හෝ සැපයුම් සම්පූර්ණ කෙරුන විට, අනුමත කිරීම, සහතික කිරීම සහ මුදල් ගෙවීම් කල යුතු වුවත්, කෘෂිකර්ම අමාත්‍යාංශය එම විධිවිධානවලට අනුකූල නොවී භාණ්ඩ සැපයීමකින් තොරව අවස්ථා 02 කදී රු. 2,195,350 ක ගෙවීම් කර තිබුණි.

(ආ) මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් Lenth Measuring Boards සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර එකී පිරිවිතරයන්ට අනුකූලව අවුරුදු 2 වගකීම් කාලයට යටත්ව එකක් රු.4,745 ක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදී නොගෙන වසරක වගකීම් කාලයකට යටත්ව රු.25,837 ක වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් එකී උපකරණ 78 ක් මිලදී ගැනීම හේතුවෙන් රු.1,645,176 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) යටිනුවර දෙල්දෙණිය ඇළ සහ අමුණුපුර පොළොන්දෙණිය, කහවතුගොඩ දෙල්ගහකුඹුර යන කුඹුරු යායන් සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් කල උපව්‍යාපෘති යටතේ සමාලෝචිත වර්ෂයේ දී රු. 703,946 ක් වැය කර පැති බැමි ඉදිකර තිබුණු නමුත්, එම බැමි කුඹුරු යායේ ආරක්ෂාවට ඉවහල් වී නොතිබුණු බව 2015 පෙබරවාරි මාසයේ දී කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී නිරීක්ෂණ විය.

(ඈ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටුකරන ලද මාර්ග සංවර්ධනය කිරීම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ඉදිකිරීම් සම්බන්ධව සම්මත ප්‍රමිතීන් අනුව කිසිදු පරීක්ෂණයක් නොකිරීම, මිශ්‍රන සංයුතිය දක්වා නොතිබීම, මාර්ගයේ නියමිත ඝනත්වය නොතිබීම, පරීක්ෂණ වාර්තා අසමත් වීම සහ සාවද්‍ය හරස්කඩ මිනුම් ඉදිරිපත් කිරීම යන කරුණු හේතුකොටගෙන ඩෙස්පොට් මෙරායා මාර්ගය ඉදිකිරීමට අදාළ ගෙවීම් අත්හිටුවා තිබුණි. 2014 ජනවාරි 30 දින සිදුකළ භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටත් මාර්ග තලයෙන් සියයට 80කට වඩා වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ඉරිතලා පුපුරා ගැලවී ගොස් තිබියදීත්, ඒ ගැන නොසලකා අසම්පූර්ණ කමිටුවක නිර්දේශය මත රු.5,019,951ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ii) කුණ්ඩසාලේ මහවත්ත මාර්ගයේ කිලෝමීටර් 0.00-370 දක්වා කොටස සම්පූර්ණයෙන්ම වැඩ නිම කිරීමෙන් අනතුරුව වෙනත් ආයතනයක් විසින් ඒ මත කාපට් ඇතිරීම නිසා අධිකාරිය විසින් දරා තිබුණු එකතුව රු.1,879,053 ක් වූ වියදම නිෂ්ඵල වී තිබුණි.

(iii) බිරිදිවෙල මාතලාපිටිය මාර්ගයේ වැඩ ආරම්භ කිරීම සඳහා දෙන ලද අත්තිකාරම් මුදලින් රු.116,025ක් අයකර නොගෙන අවසාන බිල්පත ගෙවා තිබුණි. නියමිත ඉංජිනේරු ප්‍රමිතීන්ට අනුකූලව මාර්ගය ඉදිනොකිරීම නිසා ඉදිකිරීම් නිම කර මාස 03ක් ගත වීමටත් පෙර සමස්ථ මාර්ගයෙන් සියයට 40ක පමණ කොටසක වැඩිදියුණු කරන ලද ස්ථාන, දැඩි ලෙස අබලන් වී වලවල් හැරී ගැලවී යමින් පැවතුණි. ඒ අනුව ඉදිකිරීම සඳහා දරා තිබුණු රු.3,020,234ක් වූ සම්පූර්ණ මුදල නිෂ්කාර්ය වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) අවස්ථා දෙකකදී රසායනාගාර පරීක්ෂණ වලින් අසමත් වූ රු.2,417,409ක් වටිනා ඒබීසී සහ මිලිමීටර් 37.5 ගල් තොගයක් නුගගහමුල ඉලුක්වත්ත මාර්ගය වැඩිදියුණු කිරිමේ කර්මාන්තය සඳහා නිකුත් කර තිබුණි.

(v) බරණගල පෙනිලන්ඩ් මාර්ගය වැඩිදියුණු කිරීමේදී විධායක ඉංජිනේරු වරයාගේ අනුමැතියකින් හෝ අවසරයකින් තොරව අවස්ථා දෙකකදී රසායනාගාර පරීක්ෂණ වලින් අසමත් වූ රු.1,360,175 ක ඒබීසී සහ මිලිමීටර් 37.5 ගල් වැඩ බිමට සපයා තිබුණි. අධිකාරියට අයත් අංක 42-5175 දරන ලොරි රථයෙන් අධිකාරියට අයත් මිලිමීටර් 37.5ගල් කියුබ් 19ක් සහ තාර බැරල් 06 ක් කාර්මික නිලධාරියා විසින් වංචනික ලෙස මෙම මාර්ගයේ කැඩී ගිය කොටස පිළිසකර කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණි.

6.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 අප්‍රේල් 23 දිනැති අංක සීපීසී/සීඑම්/සීබී/2014/32 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මධ්‍යම පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා වෙන්කළ නිවාස 03 ක් සඳහා ගෘහ භාණ්ඩ ලබාගැනීමට පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු.2,200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් අවස්ථා 10 කදී රු.2,196,340.76 ක් වැයකර ගෘහ භාණ්ඩ සපයා තිබියදීත්, එම නිවාස ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ "මහවැලියෙන් පවරාගත් වත්කම් නඩත්තු" යන වැය විෂයය සඳහා සලසා තිබූ රු.10,000,000 ක ප්‍රතිපාදනයෙන් පල්ලේකැලේ ජනසවිගම පිහිටි ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට සහ ඇවිදින මන්තීරු ඉදිකිරීමට රු.4,433,427 ක් වැයකර තිබුණි. අදාළ ව්‍යාපෘතියේ මුළු වැඩ ඇස්තමේන්තුව රු.4,077,911 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දින වනවිට එම ව්‍යාපෘතියෙන් සියයට 60 ක වැඩ නිමකිරීම සඳහා රු.4,433,427ක වියදම් දරා තිබුණි. ඒ අනුව මුළු වැඩ ඇස්තමේන්තුවේ වටිනාකම ඉක්මවා රු.355,516 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් අවස්ථා 6 කදී පොදු තැන්පත් ගිණුමින් රු.2,376,635 ක්ද, වැය විෂයක් යටතේ වූ ප්‍රතිපාදනවලින් රු.328,000 ක්ද අමාත්‍යාංශයේ අරමුණුවලින් බාහිර වෙනත් අරමුණු සඳහා වියදම් කර තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 30 දිනට සමූපකාර සමිති නගාසිටුවීම සඳහා සමිති 6 ක් වෙත ලබාදුන් රු.625,000 ක ණය මුදලින් කිසිදු වාරිකයක් අය වී නොතිබූ අතර, සමූපකාර සමිති 07 ක පවතින හිඟ ණය ශේෂවල එකතුව රු.3,356,995 ක් විය. තවද සමූපකාර සංවර්ධන නිලධාරීන් විසින් පිහිටුවන ලද සී/ස ආයෝජන සංවර්ධන සමූපකාර සමිතිය සඳහා ඇවර අරමුදලෙන් ගෙවා තිබූ රු.1,500,000 ක ණය මුදලට අදාල කිසිදු වාරිකයක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොබුණි.

6.6 දෘශ්‍ය අක්‍රමිකතා
-------------------

කොත්මලේ අධ්‍යාපන කලාපයේ විද්‍යාලයක විදුහල්පති ලෙස සේවය කළ අයකු විසින් ආයතන සංග්‍රහයේ 2 වන කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 24.1 ඡේදය සහ පළමු උප ලේඛනයේ 12 වන උප වගන්තිය යටතට ගැනෙන කූට ලේඛන සකස් කර ඉදිරිපත් කිරීමෙන් විශ්‍රාම යන දිනය වසර 6 කින් වැඩිකර වැටුප් වශයෙන් රු.2,157,895 ක් ලබා ගැනීම මගින් රජයේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කර තිබුණි.

6.7 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 අගෝස්තු 29 දින පැවති මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව 2009 මාර්තු 04 දින සිට 2013 ජූලි 05 දක්වා මධ්‍යම පළාත් සභාවේ පස්වන සභාවට තේරීපත් වූ නවක මන්ත්‍රීවරුන්ට ලබාදීම සඳහා රු.3,278,960 ක වියදමින් මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 34 බෙදාදීමේ ක්‍රමවේදයක් නොමැතිකමින් 2015 පෙබරවාරි 13 දින වනවිටත් ප්‍රධාන අමාත්‍යාංශ ගබඩාවේ ගොඩගසා තිබුණි.

(ආ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ තීරක අරමුදලෙන් රු.මිලියන 26.32 ක මුදලක් බැංකු 03 ක ආයෝජනය කිරීමෙන් අනතුරුව 2014 නොවැම්බර් 28 දින වනවිට එම ගිණුමෙහි තවදුරටත් රු.5,844,208 ක ශේෂයක් හා මුදල් ආයෝජනයෙන් ලද රු.697,594 ක පොලී මුදලක් නිශ්කාර්යව පැවතුණි.

6.8 ආර්ථික නොවූ ගණුදෙනු
-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේදී රු.464,000 ක වියදම් දරා මිලදී ගෙන තිබුණු කොන්ක්‍රීට් බිම් ඇතුරුම් ගල් තොගයක් නියමිත සම්පීඩන ශක්තිය නොමැතිවීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව 2015 ජූනි වන විටත් නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල භූමියේ ගොඩගසා තිබුණි.

(ආ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2014 ජූලි 30 දින රු.725,000 කට මිලදී ගෙන තිබූ Cervical traction unit (CTU) වෛද්‍ය උපකරණය හා 2011 ජූනි 13 වන දින මිලදී ගෙන දිගන රෝහල වෙත ලබාදී තිබූ රු.810,000 ක් වටිනා short wave diathermy වෛද්‍ය යන්ත්‍රයේ කොටස් කිහිපයක් අඩු බැවින් 2015 ජූලි 21 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන රෝහලේ භෞත චිකිත්සක අංශයේ තබා තිබුණි.

(ඇ) 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයෙකුට හා ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කළ හැකි උපරිම වාහන සංඛ්‍යාව 07 ක් විය. එහෙත් මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්යාලයට වාහන 12 ක් සහ ප්‍රවාහන සංචිතයෙන් වාහන 02 ක්ද, අනුයුක්ත කර තිබුණි.

(ඈ) මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබානොගෙන මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතුව සිටි නිලධාරීන් 593 දෙනෙකු පෞද්ගලික රැකියා සඳහා හා අධ්‍යයන කටයුතු සඳහාද, අධ්‍යයන හා අභ්‍යාස කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශයේ දීමනා යටතේ නිලධාරීන් 09 දෙනෙකුද විදේශ ගතවී තිබුණි.

6.9 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 2 කදී සමාන පිරිවිතරයන්ගෙන් යුතු "Defibrilotor" වෛද්‍ය උපකරණ මිලදී ගෙන තිබුණු අතර, පළමු අවස්ථාවේ මිලදීගත් උපකරණ සඳහා රු.710,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තු නිෂ්පාදනාගාරයේ අඩු පිරිවැයකින් නිෂ්පාදනය කළ හැකිව තිබූ ඖෂධ වර්ග 3 ක් ආයුර්වේද සංස්ථාවෙන් ඉහළ මිල ගණන් යටතේ මිලදී ගැනීම් හේතුවෙන් රු.92,850 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ) නියමිත වටිනාකමට තක්සේරු නොකර සර්වග්‍රාහී රක්ෂණාවරණ ලබා ගැනීම නිසා අනතුරු වලට භාජනය වී තිබුණු වාහන 02 ක් සම්බන්ධයෙන් රක්ෂණ හිමිකම් වලින් ආවරණය නොවූ රු. 102,311 ක පාඩුව පොතෙන් ලියා හැරීමට කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිර්දේශ කර තිබුණි.

(ඈ) මධ්‍යම පළාත් සභාවේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අයත් වාහන සම්බන්ධයෙන් අවස්ථා 108 කට අදාළ නොවිසඳී පවතින රු.14,537,137 ක හානි හා අවස්ථා 166 කට අදාළ රු.19,247,237 ක දේපල හානි ඇතුළුව සිදුවී තිබුණු මුළු හානිවල එකතුව රු.33,784,374 ක් විය. වසර ගණනාවක් තිස්සේ නොවිසඳී පවතින මෙම වාහන සහ දේපල හානි නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

## 6.10 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය. (ගුරු හා විදුහල්පති සේවය හැර)

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,983 | 1,429 | 554 | - |
| තෘතීයික මට්ටම | 657 | 489 | 168 | - |
| ද්විතීයික මට්ටම | 8,956 | 6,411 | 2,545 | - |
| ප්‍රාථමික මට්ටම | 4,372 | 3,813 | 559 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | 14 | 74 | - | 60 |
| එකතුව | 15,982 | 12,216 | 3,826 | 60 |

(ආ) පාසල් කාර්ය මණ්ඩල විස්තර

2014 දෙසැම්බර් 31 දිනට විදුහල්පති සේවයේ හා ගුරු සේවයේ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පති | 1,687 | 1,572 | 115 | - |
| ගුරු සේවය | 24,818 | 27,115 | - | 2,297 |
| ද්විතීයික මට්ටම | 2,044 | 1,340 | 704 | - |
| ප්‍රාථමික මට්ටම | 245 | 7 | 238 | - |
| එකතුව | 28,794 | 30,034 | 1,057 | 2,297 |

(ඇ) මධ්‍යම පළාතේ පිහිටි පළාත් පාලන ආයතන 43 හි 2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලයේ එකතුව 6,060 වූ අතර, තථ්‍ය කාර්යය මණ්ඩලය 5,765 ක් වූයෙන් පුරප්පාඩු 295 ක් පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, පළාත් පාලන ආයතන 43 හි සමහර තනතුරුවල 989 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර, ඉන් පළාත් පාලන ආයතන 35 ක වෙනත් තනතුරුවල 517 දෙනෙකුගේ අතිරික්තයක් පවතින බව නිරීක්ෂණය විය.

6.11 ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පරිපාලනය සඳහා ශීර්ෂ 16 ක් යටතේ සලසා තිබූ ප්‍රතිපාදනවලින් සියයට 14.72 සිට සියයට 64.81 අතර පරාසයක ඉතිරිවීම් තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැය විෂයයන් 04 ක් යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 17.05 ත් සියයට 73.24 ත් අතර පරාසයක ඉතිරිවීම් පැවතිණි.

(ඇ) උපමාන පාදක ප්‍රදාන යටතේ ශීර්ෂ 10 ක වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 23.79 සිට සියයට 82.60 අතර පරාසයක ඉතිරි කිරීම් පැවතුණි.

(ඇ) පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ශීර්ෂ 5 ක වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15.80 සිට සියයට 96.05 අතර පරාසයක ඉතිරි කිරීම් නිරීක්ෂණය විය.

(ඉ) විශේෂ ව්‍යාපෘති යටතේ වැය ශීර්ෂ 04 ක වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් නිරීක්ෂණය විය. ප්‍රධාන ලේකම්ගේ වැය ශීර්ෂය යටතේ "වර්ෂාවෙන් හානි වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය" සඳහා සලසා තිබූ රු.180,000,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

7.1 ක්‍රියාකාරී සැලැස්ම
----------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/12/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 1.4.1 අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 8 ක් හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

7.2 අයවැය ලේඛනමය පාලනය
---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ රු.7,000,000 ක් වූ අයවැයගත ආදායම් විෂයයන් 03 කින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු අතර, තවත් අයවැයගත ආදායම් විෂයයන් 07 ක උපයාගත නොහැකි වූ ඉලක්ක සියයට 10 සිට 80 දක්වා පරාසයක පැවතුණි. ඇස්තමේන්තුගත වියදම් සීමාව ඉක්මවා විධිමත් අනුමැතියකින් තොරව රු.2,512,479ක වියදම් දරා තිබුණි.

(ආ) මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ආදායම් විෂයයන් 27 ක ඇස්තමේන්තුගත ආදායම්වලින් රු.21,597,440 ක ආදායම් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ වාහන නඩත්තු වියදම් සඳහා වූ රු.500,000 ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.1,134,380 ක වියදම් දරා තිබුණි.

7.3 නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ 2008 හා 2009 යන වර්ෂයන්හි විගණකාධිපති වාර්තා මඟින් අනාවරණය කරන ලද විගණන ජේද 38ක් 2014 ජූලි 24 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය කර ලබා දුන් නියෝග පරිදි කටයුතු නොකිරීම නිසා ඉන් විගණන ජේද 12ක් තවදුරටත් නොවිසඳී පැවතුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ 2007 හා 2008 යන වර්ෂයන්හි විගණකාධිපති වාර්තා මඟින් අනාවරණය කරන ලද විගණන ජේද 38ක් 2012 පෙබරවාරි 14 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය කර ලබා දුන් නියෝග පරිදි කටයුතු නොකිරීම නිසා ඉන් විගණන ජේද 23ක් තවදුරටත් නොවිසඳී පැවතුණි.

(ඇ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 15 ක් වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 61 කට හා ඉකුත් වර්ෂ වලදී නිකුත් කළ විගණන විමසුම් 19 කට 2015 ජූනි 30 දින වන විට පිළිතුරු ඉදිරිපත් නොවූ අතර, එම විගණන විමසුම් වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම පිළිවෙලින් රු. 993,613,982 ක් සහ රු. 16,658,765 ක් විය.

8. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු විගණන විමසුම් මඟින් වරින් වර ප්‍රධාන ලේකම් කාර්යාලයේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ඇස්තමේන්තු පිළියෙල කිරීම

(ඈ) ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීම

(ඉ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය

(උ) අභ්‍යන්තර විගණනය